# ජංගම දුරකථන හා පරිගණක ක්‍රීඩා හරහා ළමා පරපුරට ඇතිවන අහිතකර බලපෑම් පිළිබඳව උඩුගම කලාපයේ තෝරාගත් පාසල් කිහිපයක් ඇසුරෙන් විමර්ශනාත්මක අධ්‍යයනයක්

*වී.පී.කේ. මධුෂාන්*[1]

නව තාක්ෂණයේ දියුණුව සහ මාර්ගගත අධ්‍යාපන ක්‍රමය යටතේ වර්තමානයේ බොහෝ සිසුන් ජංගම දුරකථන හා පරිගණක භාවිත කිරීමට යොමු වී ඇත. මෙම ප්‍රවේශ වීමේ ප්‍රතිඵලයක් මත ජංගම දුරකථන හා පරිගණක ක්‍රීඩාවලට ඇබ්බැහිවීමේ වර්ධනීය ගැටලුවක්ට සිසුන් මුහුණ දී සිටිති. ජංගම දුරකථන හා පරිගණක කීඩා හරහා ළමා පරපුරට ඇති කරන අහිතකර බලපෑම් අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වන අතර, ගාල්ල දිස්ත්‍රික්කයේ උඩුගම අධ්‍යාපන කලාපයේ තෝරාගත් පාසල් පහක සිසුන් පනස් දෙනෙකු වෙත යොමු කරන ලද ප්‍රශ්නාවලියක් හා එයින් අහඹු ලෙස තොරාගත් පාසල් සිසුන්ගේ දෙමව්පියන් 10ක් සම්මුඛ සාකච්ඡා සඳහා යොදාගනිමින් දත්ත රැස් කළ අතර ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන ද්විත්ත්ව ප්‍රවේශය ම මේ සඳහා යොදා ගන්නා ලදි. ප්‍රමාණාත්මක දත්ත MS excel මෘදුකාංගය භාවිතයෙන් ද, ගුණාත්මක දත්ත තේමාත්මක විශ්ලේෂණයට ලක් කරමින් දත්ත විශ්ලේෂණය කරන ලදි. දත්ත විශ්ලේෂණයට අනුව මුළු සිසුන් ප්‍රමාණය 62%ක් ඔන්ලයින් ක්‍රීඩා සඳහා යොමු වී ඇති අතර එහි වැඩි ප්‍රමාණයක් එනම් 44%ක ප්‍රතිශතයක් පිරිමි ළමයින් වේ. වර්තමාන පාසල් ළමුන්ගේ දෛනික අධ්‍යාපන කටයුතු අඩාළ වීමට ජංගම දුරකථන ක්‍රීඩා හා පරිගණක ක්‍රීඩා ඍජු ව බලපෑම් කරන ආකාරය ද ළමා මනස තුළ ඇති වන මානසික විපර්යාස මෙන් ම කායික වසයෙන් සිය දිවි හානි කර ගැනීම් වැනි ක්‍රියා සඳහා ළමුන් යොමු වීම ද ළමා පරපුර තුළ අනවශ්‍ය ප්‍රචණ්ඩත්වය හා ආවේගශීලී හැසිරීම් රටා හා ආකල්ප වැඩි වීම ද, ග්‍රාමීය ප්‍රදේශවලට සාපේක්ෂ ව නාගරික ප්‍රදේශවල බහුල ව පරිගණක ක්‍රීඩා හා ජංගම දුරකථන ක්‍රීඩා ළමා පරපුර අතර වඩාත් ප්‍රබල ව ව්‍යාප්ත වන ආකාරය ද මෙම අධ්‍යයනයේ දී හඳුනාගත හැකි ය. ජංගම දුරකථන ක්‍රීඩා, පරිගණක ක්‍රීඩා හරහා ළමුන්ගේ අධ්‍යාපනයට ඇති වන බලපෑම අධ්‍යයනය, ළමා පරපුරට මානසික හා කායික වශයෙන් ඇතිවන විපර්යාස හඳුනාගැනීම, ළමුන් වෙනුවෙන් වැඩි කාලයක් වැය කිරීමට දෙමාපියන් පෙලඹවීම මෙන් ම මෙවැනි ක්‍රීඩා හැකිතාක් දුරට අවම කර කායික හා මානසික වසයෙන් ඉහළ මට්ටමක් ඇති වන ක්‍රීඩාවලට ළමුන් යොමු කළ යුතු ය.

***ප්‍රමුඛ පදඃ*** පරිගණක ක්‍රීඩා, ජංගම දුරකථන ක්‍රීඩා, ළමුන්, අධ්‍යාපනය, අහිතකර බලපෑම්

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. kavindamadushan621@gmail.com